ලංසු කැඳවීමේ ආරාධනාවයි

Invitation For Bid (IFB)

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

ආරක්ෂක සේවා ලබා ගැනීම

කොන්ත්‍රාත් අංකය: LSD/ACC/04/Security Service/2025

1. ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල 33 ක් වෙනුවෙන් 2025/2026 වසර සඳහා ආරක්ෂක සේවා සැපයීමට සුදුසුකම්ලත් ආයතන වෙතින් ලංසු අයදුම්පත් කැඳවනු ලැබේ.

ආරක්ෂක සේවා අවශ්‍ය වන ප්‍රාදේශීය කාර්යාල	අවශ්‍ය ආරක්ෂක නිලධාරීන් ගණන
හෝමාගම,කැස්බෑව,රත්මලාන/දෙහිවල,මිනුවන්ගොඩ, මීරිගම, අත්තනගල්ල, දොම්පෙ, කටාන, පානදුර, දොළුව(ගම්පොල), යටිනුවර, උඩුනුවර, හාරිස්පත්තුව, ගඟවටකෝරලේ, කොත්මලේ, බලංගොඩ, වැලිගෙපොල, රත්නපුර, කුරුවිට, ගලිගමුව, තඹුත්තේගම, නැ.නු.ප.(අනුරාධපුර), රිදීගම, පන්නල, වාරියපොල, නාත්තන්ඩිය, , ගාල්ල, ඇල්පිටිය, මාතර, හක්මන, තිස්සමහාරාමය, බෙලිඅත්ත, මහියංගනය	එක් කාර්යාලයක් සඳහා එක් වරකට ආරක්ෂක නිලධාරීන් එක් අයෙකු (01) බැගින් යෙදවිය යුතුය.

සේවය අවශ්‍ය කාලයන්

- සතියේ වැඩ කරන දින සඳහා - ප.ව.4.00 සිට පසුදා පෙ.ව.8.00 දක්වා
- සෙනසුරාදා/ඉරිදා/ ප්‍රසිද්ධ නිවාඩු දින/පෝය දින/වෙනත් නිවාඩු දින වල - පැය 24

2. ජාතික තරඟකාරී ලංසු කැඳවීම (NCB) යටතේ මිල ගණන් කැඳවනු ලැබේ.

3. මේ සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් සහිත අයදුම්කරුවන්හට, ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් හා දෙපාර්තමේන්තුවේ සරප වෙත ආපසු නොගෙවන රුපියල් පන්දහසක (රු.5,000.00) මුදලක් ගෙවීම මඟින්, සිංහල භාෂාවෙන් සකස්කරන ලද ලංසු ලේඛන කට්ටලයක් 2025.05.16 දින සිට 2025.05.29 දින දක්වා රාජකාරී දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාලය තුළ මිලදී ගත හැක. මේ පිළිබඳ වැඩි විස්තර ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශය [දුරකථන අංක 0112-499462] මඟින් ලබාගත හැක.

4. නිසි පරිදි සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ඔබගේ ලංසු 2025.05.30 දින පෙ.ව. 10.00 හෝ ඊට පෙර ප්‍රධාන ගණකාධිකාරී, ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව, දෙවන මහල, නො.1200/6, "මිහිකත මැදුර", රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මේම දෙපාර්තමේන්තුවේ, දෙවන මහලේ පිහිටි ගිණුම් අංශයේ, ගණකාධිකාරී (ප්‍රසම්පාදන) ගේ කාර්යාලයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතුය.

5. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු විවෘත කිරීමේ කමිටුව ඉදිරියේ විවෘත කිරීම සිදුකරනු ලැබේ. ඒ සඳහා අයදුම්කරුට හෝ බලය ලත් නියෝජිතයකුට සහභාගී විය හැක.

6. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව,
නො.1200/6 ,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
2025.05.16

CamScanner